78840

AL/2007/71-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**71 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2007 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2007 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2007

| | |
|---|---|
| සිංහල | I |
| சிங்களம் | I |
| Sinhala | I |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

✻ පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1\. (අ) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨයන්හි **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් **ඡේද හතරක** අර්ථ ලිහිල් බසින් ලියන්න. **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන සඳහා ඔබ දෙන අර්ථ යටින් **ඉරි** අඳින්න.

(i) නමුත් මේ අත්බැව දෙතිස් කුණුකොටයින් එක් කොටසක් පා අළු ආදී කිසිවකට ගත නොහැකි බැවින් කපා හළ දඬු කැබලි ආදියටත් වඩා නිෂ්ප්‍රයෝජන ද එහෙයින් මේ ශරීරය රූ අරූ දිවිදු නැති වන්නා ම ශ්‍රී යහන්වල හොත්තත් දැවීම් ආදිය පොළොවට ම වන හෙයින් නොබෝ කලකින් ප්‍රයෝජන නැති හෙයින් හළ අඬුකඩක් මෙන් පොළොවට ම පැමිණෙයි. සියල්ලකට ශරීරය **ක්ෂම නොවනත්** සිත තර ව තුබූ බැවින් මෙබඳු කුණු අත්බැවූ තබා ලා තවපස්වක පමණක් මුත් වඩා කුණුකොටස් නැති දිව අත්බැවූ බඹ අත්බැවුත් නැති වීම නිසා භවක්ෂයට උත්සාහ කටයුතු යැයි වදළ සේක. මේ දේශනාව කෙළවර පූතිගත්තිස්ස තෙරුන්වහන්සේ පිළිසිඹියා පත් රහත් ව කෙලෙස්ලෙඩින් ගොඩනැගී ආයුශක්තිය එතෙක් ම හෙයින් පිරිනිවන් පෑ සේක. සෙසුත් බොහෝ දෙන නිවන් දුටුවූ ය. බුදුහු ඔබ ආදහන කරවා පියා ධාතු ගෙන දගැබක් කරවූ සේක.

නැතහොත්

බුදුහු වැඩ විචාරා වදරා මේ තියාව දන මා දෙසූ බණ මදෙකැයි කියාත් බොහෝවකැයි කියාත් නො කියව. යමෙක් තෙමේ ස්ත්‍රීවර්ණනා ආදි වූ **අර්ථාවහ නොවන** දෙයින් යුක්ත වූ සියගණන් කථාත් තමා දෙඩන්නට සුරු හෙයින් කියා නමුත් ඉන් කිසි කෙනෙකුන්ට කිසිත් ප්‍රයෝජනයෙක් පරලොවින් නැත. යම් ගාථාවක් අසා සත්වයෝ නිවන් දකිත් නම් ඒ ම යහපත. යම් කෙනෙක් තුමූ දසදහසක් පමණ වූත් සතුරු සෙනග හා සටනට ගොසින් සටන්බිම ද තමන් යෝධ හෙයින් අරුත් හැම පරදවා තුමූ ම ජය ලැබෙත් ද සිතන්නවුන්ට යහපත සේ සිතන බව මුත් ඒ සටන උතුම් නො වෙයි. යම් කෙනෙකුන් රෑ වසන තැනත් දවල් වසන තැනත් කමටහන් මෙනෙහි කිරීමෙන් දහස් ගණනකටත් වඩා සිටිනා රා දෙස් ආදි වූ කෙලෙස් සතුරන් පරදවා නිවන් රට ලැබ සිටිත් නම් සටන ජයගත්තවුන් මුළුල්ලට ම ඌ උතුම්හ යි වදළ සේක. දේශනා කෙළවර බොහෝ දෙන සෝවාන් සෙදගැමි අනාගැමි රහත් වූහ.

(ii) එකල බුදුහු ආනන්දයෙනි, ඉවත් වව, ඉදිරියෙහි නොසිටුව යි වදළ සේක. දෙවෙනි වත් අනඳ මහ තෙරුන් වහන්සේ මේ ඇත් මිනී මරන චණ්ඩ පරුෂ ය. කෝපයෙන් දිලිහි **ප්‍රලයානලවේගයෙන්** එන්නේ ය. පළමු කොට මා මරා පසු ව තුඹ වහන්සේ කරා ඒවයි කියා යාඥ කොට කියා ඉදිරියෙහි සිටි සේක. තුන්වෙනි වත් පහවව ආනන්දයෙනි, ඒ ඇතු දමනයෙහි ලීම අපට භාර යැයි වදළදීත් ස්නේහබන්ධයෙන් බැඳී ඉවත්ව යා නොහී සිටිනා හෙයින් බුදුන්ගේ ඍද්ධ්‍යනුභාවයෙන් අනඳ මහ තෙරුන් වහන්සේ වැඩ සිටි භූමිය කුඹල් සකක් මෙන් කරකැවී පසු ව ගොස් භික්ෂූන් වහන්සේ මද්ධ්‍යයෙහි සිටුවාලූ කල්හි එක් ස්ත්‍රියක් නාලාගිරියා දැක මරන භයින් භීත ව දිවන්නී උකුළෙහි උන් දරුවන් ඇතුවත් සර්වඥයන් වහන්සේටත් අතුරේ දමා ගියා ය. ඈ ලුහුබැඳ ගෙන ගිය ඇත්, දරුවන් දැක කරකැවී ආයේ ය. එකල ඒ කුමරුවා ඇතු තමා ළඟට එන්නා දැක මහ හඬින් අඬන්ට පටන් ගත්තේ ය.

(iii) එලෙස බෝධිසත්වයන් කී කල්හී, රජ්ජුරුවෝත් "යහපත තිසාමුණ මැනවැ"යි අවසර දුන්හ. එකල්හි මහා බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට ප්‍රාණඝාතාදි වූ පඤ්චදුස්සීල කර්ම, දුගතියට පමුණුවන්නේ යැයි යනාදීන් එහි ආදිනව හා ප්‍රාණඝාතාදීන් වැළකීමාදී වූ පඤ්චසීලයාගේ **ඉෂ්ටඵලය** ප්‍රකාශ කොට කියා මහරජ සිල් රක්ෂා කරවයි. දැහැමෙන් රාජ්‍ය කොට සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කරවයි. අවවාද කොට ඉක්බිති දෙවෙනි දවස් අරුණු නැඟෙන වේලෙහි මී හා විළඳ ශර්කරා පැන් අනුභව කොට රජ්ජුරුවන් හා බිසවුන් විසින් රන් තල් වැට දෙකෙක් හිඳුවා ගෙන සුවඳින් මලින් පූජා කොට සීමැදුරු කවුළුවෙන් පිටත් ව මහත් වේග ඇති හෙයින් චිත්‍රකූට පර්වතයට ගොසින් බන්ධූන් දුටහ. එකල්හි නිදුක් නිරෝගී ව සැපසේ අවුත්, පැමිණි හංස රජ්ජුරුවන් හා සුමුඛයන් දැක ප්‍රීතියෙන් පිනා ගියාහු ලබන ලද පිහිට ඇති හංස සමූහයෝ සන්තෝෂරාවයෙන් මත් ව කේකාධ්වනි පවත්වා ඉක්බිති හංසයෝ ස්වාමීනි, සතුරන් අතින් කෙසේ ගැලවී ගිය සේක් දැයි විචාළහ.

[ 2 වැනි පිටුව බලන්න.

(iv) ලෙව් හට තමන් නම කිව රිසි ඉඳක විසිති
දෙව් තුරු සුරබි සුරම්ණි සරිද කෙලෙසිති
පව් රෝ දුකුදු දුර ලත පොකුරඹ හසිති
දෙව් වෙද ඇසෙන පමණකි වියතුන් බසිති

(v) පෙර උවිඳු ගෙන ගිරිඳු සිදු සලත
පැහි පැහැද පෙණ සමුද සැවි නුමුත
මෙන උළිඳ පැහැ විහිද තෙදිගු බිත
සැදි වටද ගෙහි වඩු දගැබ දිමුත

(ආ) පහත සඳහන් උද්ධෘතයන් අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "එවිතරෙක් වී නම් මුසුප්පු වන්ට නොකැමැත්තේ ය."
(ii) "උපාසකයෙනි, තොපට යම් කිසි වස්තුවකින් ප්‍රයෝජන ඇත්තේ වී නම් ඒ අපට කියව"
(iii) "මෙවුංට වෙන වැඩක් හෑ. අරකිගෙ පස්සෙ රිංගනව මිසක්"
(iv) "මම කල්පනා කෙළේ කොහාට යනවා ද කියා නිශ්චය කරගන්න බැරිව"
(v) "එනමුත් හෑ සැතපෙන්නෙත් සිත මාගෙ දලවි ගින්නෙන්"

(ඇ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් සපයන්න.

පැලේ පිළේ ඉපදුණු මට
රාජ වාසල හුරු කොයින් ද
රජුන් ඇමතියන් නළවන
මිහිරි මුසා බස් කොයින් ද

මහ ඇදුරන් මහ කවියන්
රජගෙයි මහ බිතක්කනට
පිටදී රැළි නැගෙන බැමින්
විරුදවලි බඳනා කල

කැප නැති අඩවියෙන් මිදී
මම ආවෙමි හිස් දැතින්
යළි අතහැර නොයන විලස
උපතින් මා ලද මෙහෙවර

පිළියරණක් නැති මිනිසුනි
මම ඔබ අතරට එන්නෙමි
පිටුපා සිටියද කලකට
මා ඔබ දරුවෙකු නොවේ ද

හිස් අහසට හිස ඔසවන
සුවිසල් එක්වැම් මුදුනත
කිසි ද නොනිමෙතැයි ඒතන
සැණකෙළි වෙස් ගෙන නිවසන

රජුනට රජු මෙහෙසියනට
සිටුවර මැති ඇමතියනට
සුවසේ ලැග තලු මරන්න
උවම් සොයා වෙහෙසුණු හිය

ඔබ හදවත ගැහෙන හඬින්
විඩා නිවා සනසන්නට
පා ළඟ අඩ දණින් වැටී
අයදිමි අවසර ලබන්න

(ලකුණු 12.යි)

2. "සද්ධර්මරත්නාවලී කතුවරයා අනුගමනය කොට ඇත්තේ ගැමි ජනයාට වඩාත් ආසන්න බණ කතා රීතියකි." සද්ධර්මරත්නාවලියෙහි කතාවස්තු **දෙකක්වත්** ඇසුරු කරමින් මෙම කියමන විභාග කරන්න.

නැතහොත්

"බණ කතාවල සාමාන්‍යයෙන් සුචරිතය හුවා දක්වීමත් දුයිරිතට නිගා කිරීමත් දක්නට ලැබෙන නමුත් ජාතක චරිත ප්‍රායෝගික ජීවිතය හා බැඳුණු ඒවා වෙයි." නියමිත ජාතක කතා **දෙකක්වත්** ඇසුරු කරමින් මෙම කියමන නිදසුන් සහිත ව විමසන්න. (ලකුණු 15 යි)

www.pastpaperlk.com

3. "ආයාසකර හා අනුචිත වර්ණනා සැළලිහිණි සන්දේශයෙහි දක්නට නොලැබෙන්නේ කවියා සතුව පැවති ප්‍රතිභාපූර්ණ හා පරිණත කවිත්වය නිසා ය." උදාහරණ සහිත ව මෙම ප්‍රකාශය විභාග කරන්න. (ලකුණු 15 යි)

4. "යුගාන්තය, සුවිශේෂ නිර්මාණයක් වන්නේ එය කලාත්මක ලක්ෂණවලින් අනූන කෘතියක් වීම නිසා පමණක් නොව දේශපාලන පසුබිමක් ද එයට විෂය වී ඇති බැවිනි." මෙම කියමන නිදසුන් දක්වමින් විමසීමට ලක් කරන්න. (ලකුණු 15 යි)

www.pastpaperlk.com

5. **එඩ්ලේ ගෙදර සුනඛාවතී** කෙටි කතාව. "පවුලක වැඩිමහල් සොයුරියක සතු ආදරය, කරුණාව, දයාව හා පරාර්ථකාමිත්වය පැහැදිලි කරන්නකි." මෙම කියමන විමසුමට ලක් කරන්න. (ලකුණු 15 යි)

6. "ජනකවියෙන් ආභාසය ලැබීමේ ප්‍රවණතාව නිසා නිසඳැස් / නිදහස් කවිය රසිකයන්ගේ සිත් ඇද ගැනීමට සමත් විය." මෙය විමසීමට ලක් කරන්න. (ලකුණු 15 යි)

7. "උසස් කාව්‍යයක් ලෙස රසවිඳිය හැකි වීම ද මනමේ නාටකයෙහි විශේෂත්වයක් වන්නේ ය." මෙම කියමන නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

www.artsapi.lk

78839

AL/2007/71-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**71 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2007 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2007 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2007

සිංහල II
சிங்களம் II
Sinhala II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

※ 1, 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන ව්‍යුහගත ඡේද අතුරෙන් එකක් තෝරාගෙන රචනාවක් ලියන්න.

(i) ධ්‍රැවාසන්න ඇතැම් හිම කඳු දියවීමට පටන් ගෙන ඇතැයි වාර්තා වේ. ඒ මගින් ජනිත ජල ස්කන්ධය සමුද්‍රවල ස්වාභාවික ජල මට්ටම ඉහළ යාමට හේතු වෙයි. මෙයින් පෘථිවි ගෝලයට සිදු වන අහිසි බලපෑම් ද මෙය මෙසේ සිදු වීමට තුඩු දුන් හේතු ද විමසමින් මේ විපත නවත්වා ගත හැකි උපාය මාර්ග කවරේ ද යි පහදමින් සාකච්ඡාවක යෙදෙන්න.

(ii) ශ්‍රී ලංකාව විවිධ ස්වාභාවික සම්පත්වලින් අනූන රටකි. ඒවා හඳුනා ගෙන නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීමේ හා නිසි කළමනාකරණයක් නැතිවීමේ විපාක වශයෙන් මේ රට තවමත් දුර්වල ආර්ථික තත්ත්වයක පසු වේ. මේ තත්ත්වය මඟහරවා රටේ සමෘද්ධිය ඇති කිරීම සඳහා ගත යුතු උපාය මාර්ග කවරේ ද යි විග්‍රහ කරන්න.

(iii) "සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් ආදී ජන කොටස්වල අසමතුලිත සංඛ්‍යාවන් ගෙන් සැදුණු ලක්දිව සමාජය, ජාති, භාෂා, ආගම් භේදයෙන් භින්න නොවී එක දේශයක එක ජනතාවක් සේ ජීවත් විය යුතු කාලය එළඹ ඇත." ඒ සඳහා ඔබ ඉදිරිපත් කරන ප්‍රායෝගික ක්‍රියාමාර්ග කවරේ ද යි සාකච්ඡා කරන්න.

(iv) ඔබ විභාග සඳහා සාහිත්‍යය, විෂයයක් ලෙස හදාරනවා විය හැකි ය. සාහිත්‍ය කෘති පරිශීලනයේ අරමුණ විභාග සමත්වීම පමණක් ද? මේ පිළිබඳ ව ඔබේ අදහස් ඉදිරිපත් කරමින් විග්‍රහයක යෙදෙන්න.

(v) ලොව රටවල් අතුරෙන් වැඩි ම මාර්ග රිය අනතුරු ප්‍රමාණයක් සිදු වන්නේ දකුණු ආසියානු කලාපයෙහි වූ රටවල ය. එයිනුදු ශ්‍රී ලංකාව ප්‍රමුඛ ස්ථානයක් ගනී. මේ අනතුරු බහුල වීමේ හේතුවෙන් ශ්‍රී ලංකාවට දින පතා අහිමි වන මානව සම්පත් ද භෞතික සම්පත් ද අපමණ ය. මේ තත්ත්වය පැන නැඟීමට තුඩු දුන් හේතු පරීක්ෂා කොට එකී ආපද අවමකර ගැනීමේ ප්‍රායෝගික විසඳුම් කවරේ ද යි පැහැදිලි කරන්න. (ලකුණු 25 යි)

2. (අ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ලේඛන ව්‍යවහාරයේ ව්‍යාකරණය මවු බසෙහි සැබෑ ව්‍යාකරණ යැයි කිව යුතු භාෂණ ව්‍යාකරණය පරිග්‍රහණය කිරීමෙන් පසු, වයසින් තරමක් වැඩුණු අයකු වශයෙන් විධිමත් අධ්‍යාපනය ලබන කාල පරිච්ඡේදයේ දී, ද්විතීයක ව්‍යාකරණයක ස්වරූපයෙන් උද්ග්‍රහණය කරනු ලබන්නකි. එහෙයින් එය භාෂක සමාජයේ සෑම සාමාජිකයකුටම පොදු වූවක් නොව උගත් සාමාජිකයන්ට සීමා වූවකි. ලේඛන කුශලතාව ද ලේඛන ව්‍යාකරණය උගත් සියලු දෙනාටම ලැබෙන දායාදයක් නොවේ. උගතුන් අතරිනිදු ඡේකයන් හෙවත් (ලේඛනයෙහි) දක්ෂයන් පමණක් ලේඛන ව්‍යවහාරය පිළිබඳ ප්‍රාමාණිකයන් වශයෙන් සැලකෙන්නේත් සිදතෙහිද දැක්වුණු පරිදි "ඡේපියෝ" හෙවත් ඡේක ප්‍රයෝගම සාවද්‍ය - නිරවද්‍යතාව නිශ්චය කෙරෙන නිර්ණායකය වශයෙන් සැලකෙන්නේත් එහෙයිනි. මෙහිදී මතු වන අතුරු පැනයක් වෙයි. නූතන සිංහල ලේඛනයෙහි ලා ඡේකයන් ලෙස සැලකිය යුත්තේ කවුරුන්ද යන්න යි. ඒ අනුයා යුතු ඡේකයෝ නම්, ඇතැම් ගුරුකුල වියතුන් උපදෙස් දෙන පරිදි, සියවස් කිහිපයකට ඈත පොළොන්නරු - දඹදෙණි යුගවල විසූ ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි ගත්කරුවෝද? එසේ නැත හොත්, වර්තමානයෙහි කාලීන අවශ්‍යතා හැඳින ගෙන උගත් පාඨකයන්ට මෙන්ම සාමාන්‍ය පාඨකයන්ටද ගෝචර වන පරිදි හැඩ ගසා සකසා ගත් බසකින්, සාර්ථක ලෙස ග්‍රන්ථකරණයෙහි යෙදෙන ගත්කරුවෝද? වර්තමාන ලේඛකයන් අතුරෙහි යම් කිසිවකු, විචාරයෙන් තොරව හිතුමතේ වරන්තන ලේඛකයන්ගේ ව්‍යාකරණ රීති බිඳීමට නොගොස්, හැකිතාක්දුරට සම්ප්‍රදායානුකූල වන අතරම, භාෂා පරිණාමය හේතු කොට ගෙන යල් පැන ගිය තත්ත්වයට පැමිණ ඇති, -එහෙයින්ම අර්ථාවබෝධයට බාධක වන නැත හොත් සන්දිග්ධතාවට හේතු වන, - ඇතැම් රීති පමණක් තර්කානුකූල ලෙස සකසා ගෙන ඇත්නම්, අභිසංස්කෘත රීති භාවිතය ද සමරූපතාවෙන් යුතුව විධිමත් ලෙස කර ඇත්නම්, එබඳු ලේඛකයන්ගේ භාෂා ප්‍රයෝග ඡේක ප්‍රයෝග වශයෙන් සැලකීම එබඳෙහි වඩා හොඳ ලේඛකයන් පරපුරක් බිහි වීමට රුකුලක් වනු ඇත."

[ 2 වැනි පිටුව බලන්න.

(i) වර්තමාන ලේඛනය උචිතාකාරයෙන් සකස් කර ගැනීමේ දී බසක අතීත වියරණ රීති පමණක් ඒ ස්වරූපයෙන් ම පිහිට කොට ගැනීම කළ යුතු යයි මේ ලේඛකයා පවසයි ද?

(ii) ලියන බසෙහි ව්‍යාකරණය උගත් පමණින් දක්ෂ ලේඛකයකු විය හැකි ද?

(iii) මෙහි ද්විතීයක ව්‍යාකරණයක ස්වරූපයෙන් ඉගෙන ගනු ලබන්නේ කුමක් ද?

(iv) වඩා හොඳ සිංහල ලේඛක පරපුරක් බිහි වීමට බලපාන හේතු කීයක් මෙහි සඳහන් කර තිබේ ද? ඒ මොනවා ද?

(v) මවු බසෙහි සැබෑ වියරණය දකිය හැක්කේ කොහි ද? (ලකුණු 10 යි)

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමෙන් පසු ඔබට මුහුණ පෑමට සිදු විය හැකි ජීවන ගැටලු මොනවා ද යි පැහැදිලි ව දක්වමින් ව්‍යක්ත සිංහල භාෂාවෙන් (කටවහරින් නො වේ.) කෙටි ලිපියක් සුදුසු මාතෘකාවක් සහිත ව දින පතා පුවත් පතකට සපයන්න. (මේ සඳහා වචන 300 - 400 ක් පමණ සෑහේ.) (ලකුණු 15 යි)

3. (අ) පහත දැක්වෙන එක් එක් වාක්‍යයක, එක් පදයක අක්ෂර වින්‍යාසය සදෝස් ය. ඒ පදය පමණක් නිවැරදි කොට ලියන්න.

(i) ඉන්දු නිමිත ශිෂ්ටාචාරය නෂ්ඨාවශිෂ්ට වූවකි.

(ii) ශ්‍රවණ මධුර වචනය ඇතැම් විට නුවණ මුවහ කරයි.

(iii) භාණ්ඩයක නිශ්පාදන වියදම ඉහළ යන විට එහි අළෙවි මිල ද වැඩි වෙයි.

(iv) වියත් කලණ මිතුරන් ගේ ඇසුර, විමර්ශණාක්ෂිය තියුණු කර ගැනුමට ද හේතු වෙයි.

(ආ) පහත දැක්වෙන පද **අකාරාදි** පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

හිස, නළල, ඇස්, තොල්, ගෙල, පියොවුරු, සිහිනිඟ, උකුළ, වටොර, දඟ.

(ඉ) පහත දැක්වෙන පද **සන්ධි** කරන්න.

(i) දින ඉසුරු (ii) නෙළුම් මල් (iii) දෙ උර (iv) නීති අනුකූල

(ඊ) පහත දැක්වෙන පද **විසන්ධි** කර ලියන්න.

(i) මුදලිඳු (ii) උපනුපන් (iii) සිත්ධූපමාන

(උ) "සුන්දර" යන්නෙන් "සෞන්දර්ය" යන පදය සෑදෙන්නාක් මෙන් "උදර" යන්නෙන් සෑදෙන පදය කුමක් ද?

(ඌ) "රූපලාවන්‍ය" / "රූපලාවණ්‍ය" යන පද දෙකින් නිවැරදි පදය කුමක් ද?

(එ) "වකුටු" යන පදයෙහි ඇතුළත් තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?

(ඒ) "සුදට සුදේ මල් පිපිලා බලන්න හරි ලස්සන යි" මෙහි "සුදට සුදේ" යනු කවර වර්ගයේ පදයක් ද?

(ඔ) පහත දැක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) කර්ෂාපණ ශත සහස්‍රයක් (ii) අමන්දනන්දකර වූ

(ඕ) පහත දැක්වෙන වාක්‍යවල සදෝස් තැන් ඇතොත් නිදෙස් කරන්න.

(i) අප ගේ පාසැලේ දීප්තිමත් ආදිශිෂ්‍යයෝ ලෙස ඔවුහු බුහුමන් ලැබූහ.

(ii) වීරවර්ධනයන් ලංකාවේ ප්‍රමුඛ පුරාවිද්‍යාඥයකු වූ මහාචාර්ය පරණවිතාන සූරීන් ගේ ඇසුරට පැටුණි. (ලකුණු 20 යි)

4. (අ) පහත දැක්වෙන පදවලට මුල් වුණු **ප්‍රකෘති** රූප වෙන් කොට දක්වන්න.

(i) මුත්තණුවෝ (ii) නැන්ද (iii) උකුමනට
(iv) දෙන්නු (v) කීරියට (vi) සමහරුන්

(ආ) පහත දැක්වෙන පද අතුරෙන් උක්ත විභක්ති පදත් අනුක්ත විභක්ති පදත් වෙන් කොට ලියන්න.

(i) පියාණන් (ii) කුමාරිකාවක් (iii) කතුන්
(iv) දෙවිඳක්නු (v) මෙහෙණක (vi) අඟනක්

(ඉ) පහත දැක්වෙන පදවලට අනුරූප **පූර්ව ක්‍රියා** පද ලියන්න.

(i) බලයි (ii) කපයි (iii) මතුරයි
(iv) නටයි (v) එළඹෙයි (vi) දෙසයි

(ඊ) පහත දැක්වෙන පදවල ඇතුළත් වන **උපසර්ග** වෙන් කොට දක්වන්න.

(i) උදුල (ii) පරිහානි (iii) සබඳ
(iv) අධ්‍යක්ෂ (v) දුර්ගම (vi) උපස්ථාන

(උ) පහත දැක්වෙන නාම පදවල ඇතුළත් වන **තද්ධිත ප්‍රත්‍යය** වෙන් කොට දක්වන්න.

(i) සිසිලස (ii) කැතිති (iii) දියඹ
(iv) කැසටු (v) කෞශල්‍යය (vi) ධර්මිෂ්ඨ (ලකුණු 15 යි)

5\. (අ) පහත දැක්වෙන වාක්‍යවල සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට ලියන්න.

(i) දෙපාර්තමේන්තු ප්‍රධානියා ප්‍රශ්නවල දී ආදෙස් මෙන් ලිප්සා යන බව සේවකයෝ කියති.
(ii) ශිෂ්‍යයෝ දේශනවලට පැමිණ නොසිටි බව ආචාර්යවරයා පැවසී ය.
(iii) මේ පාසැලෙහි ගණිත ගුරුවරයකු නැත.
(iv) ගොවියා පුතුන් සමඟ කුඹුරේ නියර හදත්.
(v) ඔහුගේ මව දක්ෂ ගායිකාවක ද, නාට්‍ය ශිල්පිනියක් ද වන්නී ය.

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය **වරහන් තුළින්** තෝරා ලියන්න.

(i) අමාත්‍යතුමා ගේ පෞද්ගලික ලේකම් නම් (මා / මම) ය.
(ii) ඔහු ගේ බිරින්ද අද (නො එයි / නො එති.)
(iii) ඒ සමයෙහි වේදේහ නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය (කරති / කරයි.)
(iv) ජයරත්න හතරේ පහරක් ගසනු (ලැබී ය. / ගැසී ය.)
(v) මද්‍රී දේවිය, වෙසතුරු රජු ගෙන් ස්වාමීනි, (දරුවන් / දරුවෝ) කොහි ද යි විචාළා ය.

(ඉ) පහත දැක්වෙන වාක්‍ය, කර්ම කාරකයට හරවන්න.

(i) ආචාර්යවරයා මා රකියි.
(ii) ඇතැම් විද්‍යාඥයෝ සාහිත්‍යය ප්‍රිය කරත්.
(iii) වාස්තු විද්‍යාඥයෝ කම්කරුවන් ලවා උයන් ද මැනවින් සකස් කරවති.
(iv) මහා කවි කාලිදාසයෝ මේඝදූතය රචනා කළාහු ය.
(v) වෛද්‍යවරයා රෝග නිශ්චය කරනු වස් රෝගියා ගෙන් ප්‍රශ්න ඇසී ය. (ලකුණු 15 යි)

6\. පහත දැක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) නො හැකිළැ පිපිවනින් සිටිනා රන් පියුමක් සේ.
(ii) ආකාට අඩුකොප් දුන්නා වාගේ
(iii) මෙන රම්බා හිමි රූ සිරිනි මනා...
(iv) ගහේ කවු උල් කළ මනා ද?
(v) අසුර මථනයට නික්මුණු දෙව් පිරිසක් සේ.
(vi) ඇටි කෙහෙල් කැ උගුඩුවා වගෙයි.
(vii) රත් යකබලෙක්හි අත ඔබා ලූ එකක්නු අතු ඇද ගන්නා සේ.
(viii) කැත්ත හොඳින් කැපෙන්නේ කරෙන් කැඩෙන්නයි.
(ix) සුරඟන සුර සමඟ සුර ගහැ කෙළිනා කෙළි සේ
(x) ඉඟුරු දී මිරිස් ගත්තා සේ
(xi) නමින් කොස් වත්තේ කන්ට පොලොසුත් නැත්තේ
(xii) රුදුරු නුහුසුවන් ගේ වලගෙයි විස ය.
(xiii) බොල් විනා විකක් නැති කළවිටක් මෙන්
(xiv) කමල පත්‍රගත ජල බින්දු සේ
(xv) කම්පසේ දෙන සැර ලෙයේ දෙස බල ... නෙතගින් සබා (ලකුණු 15 යි)

7\. (i) "කැපුණ", "වැටුණ", "තෙමුණ" කවර වර්ගයට අයත් පද ද? මේ වර්ගයේ තවත් පද දෙකක් ලියන්න.

(ii) "අයුරු", "බඳු", "වැනි" යනු කවර වර්ගයේ කිනම් ප්‍රභේදයකට අයත් පද ද? එම පද වර්ගයේ එකී ප්‍රභේදයට අයත් තවත් පද දෙකක් ලියන්න.

(iii) "වතු පිටි", "අවු කොටු", "පොත පත" යන යුගල පද සෑදී ඇත්තේ කෙසේ ද? මේ වර්ගයේ තවත් යුගල පද දෙකක් දක්වන්න.

(iv) "කොපුලත්", "සිසිලස්", "මුහුළස්" කවර වර්ගයට අයත් පද ද? මේ වර්ගයට අයත් තවත් පද දෙකක් දක්වන්න.

(v) "හිමි තම **නැණ**      නැවීත්
සැදි **ගී තරග**      බෙහෙවින්
**වෙණ සිප්**      **මඟණවින්**
කෙළේ ඔහු පරතෙරට ...... මැනවින්"

මේ පද්‍යයෙහි **කළු අකුරින් යුතු පාඨ තුන** කිනම් සමාසයකට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද දෙකක් දක්වන්න.

(ලකුණු 15 යි)

[ 4 වැනි පිටුව බලන්න.

8. පහත (i) සිට (iv) තෙක් කොටස්වල දැක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

තැතහොත්

ඒවා අතුරෙන් දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියා, (v) කොටසට ද පිළිතුරු සපයන්න.

(i) දන්තජාක්ෂර

(ii) ස්වරාදේශ සන්ධිය

(iii) අව්‍යය සමාසය

(iv) ගෞරවාර්ථ ප්‍රත්‍ය හා ගෞරවාර්ථ උපපද

(v) පහත දැක්වෙන පාඨවලින් හතරකට සුදුසු ප්‍රස්තාව පිරුළු හතරක් දක්වා එයින් එක් ප්‍රස්තාව පිරුළක් යොදා ගනිමින් එහි අර්ථය ප්‍රකට වන සේ වාක්‍යයක් ලියන්න.

(අ) නැති දෙයක් ඉල්ලීම

(ආ) එක උත්සාහයකින් කටයුතු දෙකක් කර ගැනීම

(ඉ) තම කාරිය සිදු කර ගත්තාට පසු උපකාර වූවන්ට නො සැලකීම

(ඊ) අර්ථ රහිත දඬුවම් කිරීමක්

(උ) ඉඩ නැති සැතකට ආයාසයෙන් ඇතුළුවීම (ලකුණු 15 යි)

* * *

www.pastpaperlk.com www.artsapi.lk